# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
# පරිසර අමාත්‍යාංශය

## කුලියට හෝ බද්දට කාර්යාලය සඳහා ඉඩ පහසුකම් ලබා ගැනීම
## රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය

මෙම කාර්යාංශයේ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැඟිල්ලක් කුලියට හෝ බද්දට ලබා ගැනීමට අවශ්‍ය වී ඇත. එම ගොඩනැඟිල්ල පහත අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුය.

- අදාල පළාත් පාලන ආයතනයෙන් නිසි අනුමැතිය ලබාගත් ගොඩනැඟිල්ලක් විය යුතුයි.
- ගොඩනැඟිල්ලේ විශාලත්වය වර්ග අඩි ප්‍රමාණය 2500 ට වඩා වැඩි විය යුතුයි.
- කාමර සංඛ්‍යාව අවම වශයෙන් 04 ක් විය යුතුයි.
- අදාළගොඩනැඟිල්ලේ ඉහත දක්වා ඇති කාමර සංඛ්‍යාවට අමතරව පිටතින් ඇතුල්විය හැකි කාමරයක් හා වාන නවතා තැබීමට සුදුසු ගරාජයක් පැවතීම අමතර සුදුසුකමක් ලෙස සැළකේ.
- අභ්‍යන්තර වැසිකිළි 02 සහ අවම වශයෙන් පිටත වැසිකිළි 01 ක් පැවතිය යුතුයි.
- නල ජල පහසුකම් හා විදුලිය පැවතිය යුතුයි.
- රත්නපුර නගර සීමාවේ සිට ප්‍රධාන පාරට මුහුණලා කිලෝමීටර් 04 ක් (හතරක්) සීමාවේ පැවතිය යුතුය.
- ගේට්ටුවත් සහිතව ආරක්ෂිත වැට හෝ තාප්පය පැවතිය යුතුයි.
- අවම වශයෙන් වාහන 03 ක් හෝ නවතා තැබීමට ඉඩ පහසුකම් පැවතිය යුතුයි.
- කාර්යාලය වෙනුවෙන් වෙන් කරනු ලබන බිම් කොටස සම්පූර්ණයෙන්ම කාර්යාංශය වෙනුවෙන් වෙන් කල යුතු අතර වෙනත් අවශ්‍යතාවයක් වෙනුවෙන් ලබා ගත නොහැක.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන් **"රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය සඳහා ගොඩනැඟිල්ලක් කුලියට හෝ බද්දට ගැනීම සඳහා මිල ගණන්"** යන්න කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සඳහන් කොට, අදාල ස්ථානයෙහි ඔප්පු පිටපත සහ පිඹුරු පිටපතක් ද, ගොඩනැඟිලි හිමිකරුවා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක ද සහිතව 2024.09.18 දින ප.ව.2.00 ට හෝ ඊට පෙර සිය මිල ගණන් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ප්‍රධාන කාර්යාලයේ නව විද්‍යාගාර ගොඩනැඟිල්ලේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කල යුතුය. මෙම ටෙන්ඩරය විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට, ඔහුගේ බලයලත් නියෝජිතවරයෙකුට සහභාගි විය හැක.

<u>සැලකිය යුතුයි.</u>

අයදුම්පත් අතරින් තෝරාගනු ලබන ගොඩනැඟිල්ල රජයේ තක්සේරුවට යොමු කරනු ලබන අතර එම ගොඩනැඟිල්ල කාර්යාංශය සඳහා බදු හෝ කුලි පදනම මත ලබාදෙන විට ගිනි/සොර සතුරු හා ආපදා සඳහා රක්ෂණය කිරීම ද අයිතිකරුගේ වගකීම වේ.

සභාපති,<br>
ප්‍රසම්පාදන කමිටුව,<br>
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,<br>
අංක.569,<br>
එපිටමුල්ල පාර,<br>
පිටකෝට්ටේ.